**කලාප අධ්‍යාපන කාර්යාලය - මතුගම**

**දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019**

**Second Term Test - Grade 13 - 2019**

**නම** ..........................................  **බෞද්ධ ශිෂ්ටාචාරය II**  කාලය පැය දෙකයි.

වැදගත්

- I කොටසින් ප්‍රශ්න දෙකක් ද, II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 කි. (පළමු කොටසේ එක් අනු ප්‍රශ්නයකට ලකුණු හතර බැගින් ද දෙවන කොටසේ එක් අනු ප්‍රශ්නයකට ලකුණු දහය බැගින් ද හිමි වේ.

## I කොටස

01. (i) ක්ෂත්‍රිය වර්ණයට නියම කළ ස්වධර්මය නිවැරදිව ගෙනහැර දක්වන්න.

(ii) පූර්ණ කස්සප ශාස්තෘවරයාගේ ඉගැන්වීම කෙටියෙන් දක්වන්න.

(iii) සප්ත අපරිහානි ධර්ම යහපත් රාජ්‍ය පාලනයට වැදගත් වන ආකාරය සැකෙවින් දක්වන්න.

(iv) හොඳ නරක හඳුනා ගැනීමට බුදු දහමින් අනුමත කරන නිර්ණායක 3 ක් දක්වන්න.

(v) බුදුන් වහන්සේගේ 'සුගත' ගුණය හඳුන්වන්න.

02. (i) අෂ්ඨ විද්‍යා නම් කරන්න.

(ii) බුදුන් වහන්සේ පිළිබඳ සමකාලීන ඇගයීම් කළ ආගමික නායකයින් තිදෙනෙකුගේ නිර්වචන ගෙන හැර දක්වන්න.

(iii) සමාජගත යහපැවැත්මට අත්‍යවශ්‍ය සාධකයක් වන ලෝක පාලක ධර්ම පිළිබඳ පැහැදිලි කරන්න.

(iv) සමාජ සහජීවනයට 'බ්‍රහ්ම විහරණ' උපකාරී වන අන්දම පෙන්වා දෙන්න.

(v) පංචශීල ප්‍රතිපදාව සමාජ සංවර්ධනයට උපකාරී වේ. පැහැදිලි කරන්න.

03. (i) ''පුද්ගල ස්වාමිත්වය බුදු දහම අගය කරයි.'' පැහැදිලි කරන්න.

(ii) අල්පේච්ඡ ජීවිතයක වටිනාකම ගෙන හැර දක්වන්න.

(iii) සදිසා නමස්කාරයේ දැක්වෙන ගුරු සිසු සබඳතාවයට අයත් යුතුකම් හා වගකීම් ගෙනහැර දක්වන්න.

(iv) ''භෝග විනාශ මුඛ'' වලින් ඈත් වීමෙන් උදාවන සමාජ සුභ සිද්ධිය පැහැදිලි කරන්න.

(v) සක්විති රජෙකු විසින් ක්‍රියාත්මක කළ යුතු රාජ්‍ය පාලන ප්‍රතිපත්තිය කුමක්දැයි හඳුන්වා දෙන්න.

## II කොටස

04. (i) ප්‍රාග් බෞද්ධ භාරතීය දේශපාලන ව්‍යුහය තුළ පැවති පාලන ක්‍රම පිළිබඳ විවරණයක් කරන්න.

    (ii) බුද්ධකාලීන භාරතීය පාලකයන් හා බුදුරජුන් අතර පැවති සබඳතා ගෙනහැර දක්වන්න.

05. (i) දැහැමි ධනෝපායනය හා සම්පත් පරිභෝජනය සමාජ සංවර්ධනයට ඉවහල් වන අයුරු පෙන්වා දෙන්න.

    (ii) සෞන්දර්ය රසාස්වාදය බුදුදහම අවතක්සේරු නොකළ බව බුද්ධ චරිතය හා ශ්‍රාවක චරිත ඇසුරින් පෙන්වා දෙන්න.

06. (i) ප්‍රථම හා දෙවන සංගීතීන්හි පසුබිම කෙටියෙන් හඳුන්වා ශාසන චිරස්ථිතිය උදෙසා තෙවන සංගායනාවේ සේවය අගයන්න.

    (ii) සම්බුද්ධ ශාසනය උදෙසා අශෝක රජුගේ දායකත්වය හා කණිෂ්ක රජුගේ දායකත්වය පැහැදිලි කරන්න.

07. (i) වලභි විශ්වවිද්‍යාලය තුළින් ධර්ම ශාස්ත්‍රීය සංවර්ධනය විෂයෙහි ලැබුණු දායකත්වය ඇගයීමට ලක් කරන්න.

    (ii) චීනයට බුදු දහම හඳුන්වා දීම තුළින් එරට සංස්කෘතිය බුදු දහමින් පෝෂණය වූ ආකාරය පෙන්වා දෙන්න.

08. (i) ප්‍රාග් මහින්ද යුගයේ ශ්‍රී ලංකාවේ පැවති ආගමික ඇදහිලි හා විශ්වාස හඳුන්වා දී ඇතැම් සංකල්ප බුදු සමයට අනුව හැඩ ගැසුණු අයුරු පැහැදිලි කරන්න.

    (ii) සන්නිවේදන මාධ්‍යක් ලෙස බෞද්ධ චිත්‍ර කලාව ප්‍රබල මාධ්‍යක් වී ඇති අයුරු පෙන්වා දෙන්න.